**<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව</u>**

**<u>රැකියා විරහිත උපාධිධාරීන්/ඩිප්ලෝමාධාරීන් රැකියාගත කිරීම - 2020 යටතේ බඳවාගත් උපාධිධාරීන්/ඩිප්ලෝමාධාරීන් ස්ථිර පදනමින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීම - 2022 ii අදියරයේ සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ දැන්වීම.</u>**

උපාධිධාරී අභ්‍යාසලාභීන් ස්ථිර පදනම මත මධ්‍යම පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට අදාළ **ii** අදියරේ සම්මුඛ පරීක්ෂණය ඉදිරි දිනකදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

සම්මුඛ පරීක්ෂණ සඳහා **<u>ඔබට වෙන්කර ඇති දිනය හා වේලාව ඉදිරියේදී දැනුම් දෙනු ලැබේ</u>**. තවද මින් ඉදිරියට මෙම බඳවා ගැනීමට අදාළව සිදුකරනු ලබන දැනුවත් කිරීම් අපගේ නිල වෙබ් අඩවිය වන **www.psc.cp.gov.lk** හි පළ කරන බැවින් එම වෙබ් අඩවිය පරිශීලනය කරන ලෙස ද කාරුණිකව දන්වමි.

සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් **<u>ලිපි ලේඛනවල මුල්පිටපත් සහ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද එම ලිපි ලේඛනවල ඡායා පිටපත් කට්ටලයක්</u>** සූදානම් කර ගන්නා ලෙස දන්වා සිටිමි.

I. උපාධිධාරී අභ්‍යාසලාභී පුහුණුව සඳහා කැඳවීමේ ලිපිය/ දිස්ත්‍රික් ලේකම් විසින් අභ්‍යාසලාභී පුහුණුව සඳහා ආයතනයක් වෙත අනුයුක්ත කරනු ලැබූ ලිපිය

II. උප්පැන්න සහතිකය

III. ජාතික හැඳුනුම්පත

IV. නමේ වෙනසක් ඇත්නම් එය සනාථ කිරීමට දිවුරුම් ප්‍රකාශයක්

V. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධි සහතිකය සහ උපාධි විෂයයන් හා ප්‍රතිඵල සටහන් සහිත විස්තරාත්මක සහතිකය

VI. උපාධිධාරී අභ්‍යාසලාභී පුහුණු කාලසීමාව තහවුරු කෙරෙන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉදිරිපත් කරන ආයතන ප්‍රධානියාගේ නිර්දේශය හා අයැදුම්කරුගේ තොරතුරු පත්‍රිකාව (ඇමුණුම 01) **(මුල්පිටපත පමණක් රැගෙන ඒම ප්‍රමාණවත්ය.)**
**** මධ්‍යම රජයේ හෝ වෙනත් පළාත් සභාවක සිට ස්ථාන මාරුවී පැමිණ ඇත්නම් එම කාල සීමාව සඳහා එම ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ අවශ්‍ය වේ.**

VII. ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ **DS 4** සහතිකය. **(මුල්පිටපත පමණක් රැගෙන ඒම ප්‍රමාණවත්ය.)**

* සම්මුඛ පරීක්ෂණ සංවිධානය සඳහා කෙටි කාලසීමාවක් ඇති බැවින් ඉහත සහතික පත්‍ර හා ලියවිලි සූදානම් කර ගැනීම සඳහා වූ පූර්ව දැනුම් දීමකි.